**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **11 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 11** |
| **First Term Test** | **2018** | **Grade 11** |

| | |
|---|---|
| ***පෙරදිග සංගීතය - I*** | ***පැය 1 යි*** |
| ***Oriental Music - I*** | ***1 Hour*** |

**නම/විභාග අංකය ...........................................................................................................................**

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. තාලයේ මාත්‍රා ගණන වන්නේ,

(I) 8කි. (II) 6කි. (III) 16කි. (IV) 10කි.

02. ජප් තාලයේ එලි ස්ථානය පිහිටා ඇත්තේ,

(I) පළමු මාත්‍රාවේය. (II) 6වන මාත්‍රාවේය. (III) තුන්වන මාත්‍රාවේය. (IV) අටවන මාත්‍රාවේය.

03. තාලයක ප්‍රබලම ස්ථානය හඳුන්වන්නේ ,

(I) සමග්‍රහය නමිනි. (II) අනුතාල නමිනි. (III) බලිය නමිනි. (IV) වාදි නමිනි.

04. ම - නි ස්වර දෙක වර්ජිත වන රාගයක් වන්නේ,

(I) යමන් (II) නභෛරවි (III) භූපාලි (IV) කාෆි

05. යමන් රාගයේ වාදී සංවාදි ස්වර වන්නේ,

(I) ග නි (II) ප ස (III) රි ම (IV) ම ස

06. භූපාලි රාගය ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද ගීතයක් වන්නේ,

(I)සුවඳ පද්ම (II) ඇසේ මධුර (III)ගුමු ගුමුව වදුලේ (IV) ලංකා ලංකා

07. "එන්න මද නලේ" යන ගීතය ඇසුරු කර ගත් රාගය වන්නේ,

(I)භෛරවි (II)යමන් (III)භූපාලි (IV)බිලාවල්

08. කල්‍යාණ මේල ගත රාග යුගලය වන්නේ,

(I) යමන් - කාෆි (II) භූපාලි - කාෆි (III) යමන් - භූපාලි (IV) භෛරවී - යමන්

09. බිලාවල් රාගය පිළිබඳ වැරදි කියමන කුමක්ද ?

(I) සම්පූර්ණ සම්පූර්ණ ජාති රාගයකි. (II) රාත්‍රි ප්‍රථම ප්‍රහරයේදි ගැයේ.

(III) ධ, ග වාදි සංවාදී වේ (IV) ග රි ග ප ධ නි සං - මුඛ්‍යාංගයය වේ.

10. කෝකිල වන්නම ගායනයේදී තාල වාදනය සඳහා යොදා ගනු ලබන අවනද්ධ භාණ්ඩය වන්නේ,

(I) ගැටබෙරය (II) පහතරට බෙරය (III) උඩැක්කිය (IV) දවුල

11. බෙම්ටෝ තාලයට ගැයෙන ගීතයකි.

(I) රත්නදීප (II) සුවඳ පද්ම (III) දියගොඩ සැම තැන (IV) ඕලු නෙළුම්

12. ත්‍රිතාලයේ මාත්‍රා ගණනට සමාන වීමට පහත දැක්වෙන එක් තාලයක් ආවර්ත 2ක් වාදනය කළ යුතුය. එම තාලය කුමක්ද

(I) දාදරා (II) කෙහෙර්වා (III) බෙම්ටෝ (IV) ජප් තාලය

13. සමුද්‍ර ඝෝෂ විරිතට අනුව ගායනය කළ හැකි ගී පදයකි.

(I) සඳ වා සුදු වැලි (II) රූගත් සුරා (III) රෑ රූසේ (IV) පැහැසරණිය

14. උපමා, උපමේය, එළිවැට, අනුප්‍රාස - රස ආදිය ඇතුළත් කර රචනා කර ඇති ගී විශේෂය

(I) ගැමි ගී (II)සේ ගී (III) මෙහෙ ගී (IV) නැළවිලි ගී

15. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයක් වන්නේ,

(I) හුණුවටයේ කථාව (II) මනමේ (III) අබුද්දස්සකෝලම (IV) බෙරහඬ

16. තබ්ලාවෙන් වාදනය සඳහා වඩාත් සුදුසු පද කොටස වන්නේ,

(I) දොමි කිත/කිත දොම් (II) රත් තං කිට/දිත් තං-

(III) ජිං ජිමි කිට (IV) ධධිනා / ධතුනා

- **ප්‍රශ්න අංක 17 – 20 දක්වා පිළිතුරු සැපයීමට පහත වගුව උපයෝගී කර ගන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| කෝලම් සම්ප්‍රදාය | සබරගමු වන්නම් | පහතරට සිංදු වන්නම් | උඩරට වන්නම් |

17. ඉහත සඳහන් ABCD සම්ප්‍රදායන් සඳහා වඩාත් ගැලපෙන තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙලින්,

(I) පහතරට බෙරය, දවුල, යක් බෙරය, උඩරට බෙරය (II) පහතරට බෙරය, ගැටබෙරය, දවුල, යක් බෙරය

(III) පහතරට බෙරය, දවුල, ගැටබෙරය, යක් බෙරය (IV) යක් බෙරය, දවුල, ගැටබෙරය, පහතරට බෙරය

18. ”කොහොවි යනා හඬ නඟනා” ගීතය අදාළ වන වන්නම් සම්ප්‍රදාය වන්නේ,

(I) A (II) C (III) B (IV) D

19. වෙස් මුහුණු පැළඳ කරන නර්තන සම්ප්‍රදාය අයත් කොටස වන්නේ,

(I)B (II) C (III) A (IV) D

20. දොමි කිත / කිත දොම් යන බෙර පදය අයත් වන්නේ,

(I)A (II)D (III)C (IV)B

21. කපිරිඤ්ඤා සංගීත ශෛලියට අනුව ගායනා කළ හැකි ගී පදය වන්නේ,

(I) ඕලු පිපීලා (III) මී වදයකි ජීවිතේ (III) වදිමු සුගත (IV) උඩරට කඳුකර

22. 𝄋 මෙම සංකේතය හඳුන්වන නාමය වන්නේ,

(I) රිපිටේෂන් මාර්ක් (II) සයින්ටු සයින් (III) ටයිම් සිග්නේචර් (IV) ස්කේල්

23. තබ්ලාව වාදනයේදී දැතම යොදා ගනිමින් උපදවනු ලබන අවනද්ධාක්ෂර දෙකක් වන්නේ,

(I) තින් හා තා ය. (II) ධින් හා ධ ය. (III) තිට හා තා ය. (IV) කත් හා තු ය.

24. නූර්ති සංගීතය තුළ පිළිබිඹුවන සංගීත සම්ප්‍රදාය වන්නේ,

(I) දේශීය ජන සංගීත සම්ප්‍රදාය (II) වංග සංගීත සම්ප්‍රදාය

(III) උත්තර භාරතීය සම්ප්‍රදාය (IV) දක්ෂිණ භාරතීය සම්ප්‍රදාය

25. ගසල් ගායනා ශෛලිය,

(I) ගීත නාටක ගායනා ශෛලියකි. (II) මුද්‍රා නාටක ගායනා ශෛලියකි.

(III) චිත්‍රපටි ගීත ශෛලියකි. (IV)සරල ශාස්ත්‍රීය ගායනා ශෛලියකි.

26. නාඩගම් සංගීත සම්ප්‍රදාය සඳහා ආභාෂය ලබා ඇත්තේ,

(I)උත්තර භාරතීය සංගීතය (II)දක්ෂිණ භාරතීය සංගීතය

(III) වංග සංගීතය (IV) පෘතුගීසි ගායනා ආභාසය

27.ති ර්ලානා, පසන් නැමැති තාලපද වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩය වනුයේ,

(I) උඩැක්කිය (II) ඩෝල්කිය (III) තබ්ලාව (IV) මද්දලය

28. ශාන්ත රසය හා කරුණා රසය ගැබ්වී ඇති පදමාලාවකට නවතම තනුවක් රාගාශ්‍රිතව නිර්මාණය කිරිමේදී වඩාත් සුදුසු රාගය වන්නේ,

(I) භෛරවි (II) භූපාලි (II)යමන් (IV)බිලාවල්

29. ශකීර් හුසේන් සහ ජග්ජිත් සිං යන භාරතීය සංගීතඥයින් දෙදෙනා ප්‍රකට පවතින සංගීත භාණ්ඩ යුගලය වනුයේ,

(I) තබ්ලා වාදනය හා බටනලා වාදනය සඳහා (II) තබ්ලාව වාදනය හා ගසල් ගායනය සඳහා

(III) සිතාර් සහ බටනලා වාදනය සඳහා (IV) වංග ගී හා ඛ්‍යාල් ගායනා සඳහා

30. බටහිර සංගීතයට අනුව හඩතල හතරම වාදනය කළ හැකි සංගීත භාණ්ඩය වන්නේ,

(I) පියානෝව (II) චෙලෝ (III)සැක්සෆෝනය (IV)බොක්ස් ගිටාරය

- **අංක 31 සිට 34 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් ස්වර පුවරු රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**




31. භූපාලි රාගයට අදාළව අංකනය කර ඇති ආරෝහණ ස්වර ඇති පිළිතුර තෝරන්න.

(I) 5 6 8 11 13 15 (II) 2 4 6 9 11 14 (III) 6 8 10 13 15 18 (IV) 3 5 6 10 13 17

32. වයලීනයේ තත් සතර පෙරදිග ක්‍රමයට සුසර කරන අංක අනුපිළිවෙල වනුයේ,

(I) 1 8 11 15 (II) 1 6 13 18 (III) 6 10 13 17 (IV) 11 6 10 13

33. ඉහත ස්වර පුවරුවේ 6, 10, 13 යන අංක වලට හිමි ස්වර තුන එකතු වීමෙන් සැදෙන කෝඩ් (Chard) එක කුමක්ද ?

(I) F Major (II) G Major (III) C Major (IV) D Major

34. මධ්‍ය ස ස්වරයේ හා උච්ච ස ස්වරයේ සංඛ්‍යාත පිළිවෙලින්,

(I) 250 – 500 වේ. (II) 256 – 512 වේ. (III) 255 – 512 වේ. (IV) 652 – 215 වේ.

35. විද්‍යුත් මාධ්‍ය මගින් කරනු ලබන ඉගෙනුම හඳුන්වන්නේ,

(I) E – Music (II) E – Learning (III) Midi File (IV) Learning

36. ගායනයේදී විෂම ග්‍රහයෙන් ඇරඹෙන ගී පදය වන්නේ,

(I) සසර වසනතුරු (II) ලංකා ලංකා

(III) රත්නදීප ජන්ම භූමි (IV) හෙළ ජාතික අභිමානේ

37. ශබ්දය ග්‍රහනය කර ගැනීම සඳහා භාවිතා කරන තාක්ෂණික උපකරණය වනුයේ,

(I) ඇම්ප්ලියර් - (Amplifier) (II) මයික්‍රොෆෝනය -(Microphone)

(III) මික්සර් - (Mixer) (IV) ස්පීකර් - (Speaker)

38. සුළු මැදුම් දෙතිතේ රිද්ම රටාවට සමාන වන හින්දුස්ථානි තාලය වන්නේ,

(I) දීප්චන්දි තාලය (II) ජප් තාලය (III) දාදරා තාලය (IV) බෙම්ටෝ තාලය

39. 4/4මෙම සංකේතය අපරදිග සංගීතයේදී හඳුන්වන්නේ කුමන නමකින්ද ?

(I) Time Signature (II) Key Signature (III)Rest Mark (IV) Sign to Sign

40. ව්‍යවහාරික සරල සංගීත ස්වර ප්‍රස්ථාරවල දක්නට ලැබෙන සංකේත අතරින් REPITATION MARK (රිපිටේෂන් මාර්ක්) එකක් නොවන්නේ,

(i)  (ii)  (iii)  (iv) 

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය | 2018 | 11 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | 2018 | தரம் 11 |
| **First Term Test** | 2018 | **Grade 11** |

| | |
|---|---|
| *පෙරදිග සංගීතය - II* | *පැය 2 යි* |
| *Oriental Music - II* | *2 Hour* |

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.

I. සියළුම ස්වර ශුද්ධ වූ ස්වර පහේ රාගය කුමක්ද ? (ල . 01)
II. සස රිරි ගග මම ප යන ස්වර මාලාව අයත් රාගය නම් කරන්න. (ල . 01)
III. බිලාවල් රාගයේ වාදී/සංවාදී ස්වර නම් කරන්න. (ල. 02)
IV. පෙරදිග සංගීතය .........................සිද්ධාන්තය මත පදනම් වන අතර අපරදිග සංගීතය ......................යන සිද්ධාන්තය මත පදනම් වේ. (ල.02)
V. ජන ගී වර්ගීකරණය අනුව අනාඝාතාත්මක මෙහෙ ගී ......................... වර්ගයටද ප්‍රශස්ති වන්නම් .................................... වර්ගයටද අයත් වේ. (ල. 01)
VI. තාලයක ප්‍රබලම ස්ථානය හඳුන්වන්නේ කුමන නමකින්ද ? (ල.01)
VII. සැදෑ / කළුවර/කුරග /ගා-විත් මෙම ගී පාදය සඳහා පදනම් වූ තාලය නම් කරන්න. (ල.01)
VIII. පණ්ඩිත් රවිශංකර්තුමා ................................................ වාදනය සඳහා අති දක්ෂයෙකි. (ල.01)
IX. ගමප පප-/ගමප පප- / මෙම ස්වර ලිපිය ලියා දැක්වීමට බටහිර සංගීතයේදී ................................ තාල සංකේතය යෙදිය යුතු අතර ධපධ /ස-රි/ යන ස්වර ප්‍රස්තාරය ලියා දැක්වීම සඳහා ........................................ යන තාල සංකේතය ලියා දැක්විය යුතුය. (ල. 01)
X. නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ තාල වාද්‍ය භාණ්ඩය ................................වන අතර නාඩගම් සම්ප්‍රදායේ තාල වාද්‍ය භාණ්ඩය ................................ වේ . (ල.01)

02. i කාපි රාගයට අයත් ආරෝහණ/අවරෝහණ, ජාති වාදී, සංවාදී යන විස්තර ලියා දක්වන්න. (ල. 05)

ii එම රාගයට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක ස්ථායී කොටස ගීත/ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ල. 05)

iii එම රාගයට අයත් මුඛ්‍යාංගය ලියා දක්වන්න. (ල.02)

03. i ත්‍රිතාලයට අයත් ඨේකාව (මූල පදය) නියමිත තාල සංඥා සහිතව පද ප්‍රස්තාර කර දක්වන්න. (ල.06)

ii එම තාලයට ගායනය කළ හැකි හෝ වාදනය කළ හැකි ඕනෑම ගීතයක් හෝ වාදිතයක් මුල් කොටස ප්‍රස්තාර කර දක්වන්න. (ල. 06)

04.i ග ප ධ නි /ස් - ධ ප / ම ග ම රි / ස රි ස - ඉහත රාගයට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි කොටස හෝ වාදිතයත් ප්‍රස්තාර කර දක්වන්න. (ල. 04)

ii රාගයේ නම ලියා දක්වන්න. (ල. 04)

iii කෙටි තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ල.04)

05. i තබ්ලාවක රූප සටහනක් ඇඳ පහත සඳහන් කොටස් නම් කරන්න. (ස්‍යාහි, වාන්ට්, ලව,ගජරා) (ල.04)

ii දයාවෙන් උපදින අක්ෂර 02ක් හා බයාවෙන් උපදින අක්ෂර 02ක් ලියන්න. (ල.04)

iii තබ්ලාවේ නිර්මාතෘවරයා සහ භාරතයේ ප්‍රචලිත තබ්ලා වාද්‍ය ශිල්පියෙකු නම් කරන්න. (ල.04)

06 i පහතරට වන්නමක කොටස් නම් කරන්න. (ල. 04)

ii පහතරට සිංදු වන්නම්වල සුවිශේෂ ලක්ෂණ 4ක් ලියන්න. (ල.04)

iii ඔබ උගත් පහතරට වන්නමක තානම ලියා දක්වන්න. (ල.04)

07. පහත දැක්වෙන පාරිභාෂිත පද අතරින් 3ක් තෝරා ගෙන කෙටි විග්‍රහයක් කරන්න.

I. වාදි
II. සංවාදි
III. වර්ජිත ස්වර
IV. රාග
V. මේල

(ල. 4 X 3= 12)